| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | ZEOM කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>Zonal Education Office - Minuwangoda |
|---|---|

| වාරය - දෙවන වාරය | | |
|---|---|---|
| ශ්‍රේණිය : 10 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 11 වන පාඩම<br>පැරණි ජීවනෝපාය ක්‍රම හා බැඳුණු සිරිත් විරිත් |

**පෙළපොතෙහි හමුවන පාඩම සැකෙවින් :-**

## වී ගොවිතැන .....................




- ලංකාවේ ශිෂ්ටත්වය ගොඩනැගුනේ වී ගොවිතැන මුල්කරගෙනය.
- ධාර්මික රැකියා පිළිබඳව බෞද්ධාගමේ ද ඉගැන්වේ.
- වගාව ඇරඹුණු දින සිට අස්වනු නෙළගන්නා තෙක් සෑම පියවරක් ම අනුගමනය කළේ ඉමහත් භක්තියකිනි.
- වී ගොවිතැන හා බැඳුණු පුද පූජා හා සිරිත් විරිත් රාශියකි.
- ගොවිතැන හා වැව එකට බැඳී ඇත.
- වැව ආශ්‍රිත සංස්කෘතිය, ගමයි , පන්සලයි, වැවයි , දාගබයි යන සංකල්පය බිහි වී ඇත.
- ලංකාවේ ස්වාධීන සභ්‍යත්වයක හෙවත් ශිෂ්ටත්වය පණ්ඩුකාභය රජුගෙන් ආරම්භ වූ බව මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසයි.
- වැවකින් ගොවිතැන සඳහා පළමුවන වරට ජලය නිකුත් කිරීම දියවර මංගල්‍යයයි.
- එහිදී වැ කන්ද මත කිරි උතුරුවා වැව් ජලයට වැඳ සුබ නැකතතින් ගොවිබිම වෙත ජලය නිකුත් වෙයි.
- කුඹුර- කෙත, ලියද්ද, වෙළ, උබර, කොඹර, ඉස්සර, වගා ඉස්සර, වගා පංගුව යනාදී විවිධ නම්වලින් විවිධ පළාත් වලදී හඳුන්වනු ලබයි.
- වගාවේදී භාවිත කළ අත්තම් ක්‍රමය සිංහල ජනතාවගේ අන්‍යෝන්‍ය සහයෝගීතාව පෙන්නුම් කරයි.
- කෘෂිකාර්මික කටයුතු වල නොයෙදුණු අය වෙනත් වෘත්තීන්වල නියළුණු අතර ඔවුන් තම නිෂ්පාදන ගොවි නිෂ්පාදන සමග හුවමාරු කර ගත් හ.
- කමත ගොවියන් විසින් අසීමිත භක්තියකින් සලකන ලද ස්ථානයකි. එදිනෙදා ව්‍යවහාරයේ යෙදෙන ස්ථාන ද්‍රව්‍ය ආදියට කමතේ දී වෙනම ව්‍යවහාර භාෂාවක් භාවිත කෙරිණි.
- සතුන්ගෙන් හා වල් පැළෑටි වලින් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා පරිසර හිතකාමී සහ සතුන්ට හානිකර නොවන විවිධ උපක්‍රම භාවිත කළහ.
- ගොවියෝ තම කෘෂිකාර්මික කටයුතු සඳහා සැමවිටම සුබ දවස්, සුබ නැකත්. යොදා ගත්හ.
- වෙද මහතා , මුල් ගුරුතුමා වැනි ගමටම සේවය සලසන අයගේ කුඹුරුවල කාර්යයන් ද ගමම එකතු වී ඉටු කර දුන්හ.
- අස්වැන්නේ අග්‍ර කොටස ගෙන විවිධ පුද සිරිත් සිදුකළේ ගොවිතැන සඳහා උදව් කළ නොපෙනෙන බලවේග වලට පින් පැමිණීමට හා කෘතගුණ සැලකීමට ය.




- උතුරු ඉන්දීය ජනතාව මෙරටට පැමිණීමටත් පෙර සිටම පැවති කෘෂිකර්මාන්තයකි.



- කැලෑව කපා කොටා එළිකර ගිනි තබා වගාව සඳහා සකස් කරගන්නා භූමි ප්‍රදේශය හේන යනුවෙන් හැඳින්වෙයි.
- භූමිය පිළිබඳ කරුණු රාශියක් සලකා බැලීමෙන් පසු හේන සඳහා බිම් කඩ තෝරා ගැනිණි.
- හේන සඳහා තෝරාගත් බිමේ තෝරාගත් පළමුවන පඳුර කපා දැමීම, "හේන් ඇල්ලීම " "හේන් ගෙවඩීම," " වල්දැල්වීම " යන නම් වලින් හඳුන්වයි. වල් ඇල්ලීම සඳහා ද සිරිත් විරිත් ඇත.
- හේන් ඇල්ලීම සඳහා තෝරාගන්නා ගස් වර්ග පිළිබව ද සම්මතයක් ඇත.
- හේන් ගිනි ලෑමේ දී අවට සතුන් පළවා හැරීම සඳහා හූ යාදින්න/ගිනි යාදින්න කියනු ලැබේ.
- හේන් ගොවිතැනේදී ද අත්තම් ක්‍රමය භාවිතයට ගැනිණි.
- හේන් ගිනි ලෑමෙන් පසුව ලැබෙන අලුත් වැස්ස "අක්වැස්ස" නම් වේ.
- අලින්ගෙන් හේනට සිදුවන හිරිහැර වැළැක්වීම සඳහා හේන් ගොවියෝ විවිධ උපක්‍රම යොදති.

## මැටි කර්මාන්තය .............





- ගල් යුගයේ දඩයම් ජීවිතයෙන් ගොවි ජීවිතයට මාරුවීමත් සමග මැටි කර්මාන්තයට අවශ්‍ය පදනම සකස් වී ඇත.
- ලංකාවේ පැරණි මැටි බඳුන් අවශේෂ හමු වී ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොළ, දොරවක කන්ද ගල්ලෙනෙනි.

- අතීත මැටි කාර්මිකයා හඳුන්වා ඇත්තේ " කුම්භකාර" නමිනි. කුම්භ යනු කළය යි. - කාර යනු කරන්නා යන්න යි..
- මැටි කර්මාන්තයෙහි සිංහලයාගේ බුද්ධිය ඉහළ ය. එය විස්මය දනවන සුලු ය.
- ගඟෙන් මැටි හාරා ගැනීමට පෙර මැටි කාර්මිකයා සිරිත් විරිත් ගණනාවක් අනුගමනය කරයි.
- මැටි කර්මාන්තය ආශ්‍රිතව ජනකවි නිර්මාණය වී ඇත.
- මැටි කාර්මිකයන්ගේ විවාහයේ දී මැටියෙන් තැනූ වේදිකාවක් නිර්මාණය කෙරෙයි.
- මැටියෙන් තැනූ ඇට මාලයක් මනමාලයා මනමාලියගේ කරේ පළඳවයි.
- සකපෝරුව - මනමාලියගේ පාර්ශවය විසින් දායාද වශයෙන් මනමාලයාට දෙනු ලබයි.
- මැටි කාර්මිකයෙකුගේ නිවසක දරු උපතක දී ද මැටි කර්මාන්තය ආශ්‍රිත සිරිත්විරිත් අනුගමනය කෙරෙයි.
- මැටි කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගන්නා මහපොළවට මැටි කාර්මිකයා වැඳුම් පිදුම් කළේ ය.
- ලෙඩ දුක් ව්‍යසන වලදී ඔවුන් පිහිට පැතුවේ කැලෑ දෙවියන්ගෙනි.

පෙළපොතෙහි පාඩමේ කියවීමේදී හමුවන අමාරු වචන වල තේරුම් කිහිපයක් පහත සඳහන් කරමි.

1. සභ්‍යත්වය - ශිෂ්ටභාවය
2. අර්ථ ක්‍රමය - ආර්ථික ක්‍රමය
3. සම්මා කම්මන්ත - යහපත් කර්මාන්ත
4. චිරස්ථායි - දිගු කලක් පවත්නා සුළු
5. වෘත්තිය - රැකියා
6. අත්‍යන්තයෙන් - අසීමිත
7. මහාර්ඝ - ඉතා වටිනා
8. වාරි සංස්කෘතිය - වැව් ආශ්‍රිත සංස්කෘතිය
9. පිටුබල - උදව්
10. දියවර මංගල්‍යය - ගොවිතැන සඳහා වැවකින් පළමුවරට ජලය නිකුත් කිරීම
11. වැ කන්ද - වැව් කණ්ඩිය
12. දාස - වැඩකාරයා/ ගමේ ප්‍රධාන පවුලවල සේවක සේවිකාවන්
13. වෙහෙර් දසුන් - විහාරස්ථාන වල සේවකයන්
14. අත්තම් ක්‍රමය - ශ්‍රමය හුවමාරුව කෙනෙකුගේ වැඩට තවත් අය උදව් වීම
15. කයිය - කුඹුරේ ගොයම් කැපීමේ අවස්ථාව
16. ඇඹුල - ගොවිතැනේදී සහභාගී වන්නන්ට පිළියෙළ කරන ආහාරය
17. කමත - ගොයම් පාගන ස්ථානය
18. උදලු ගොයියා - උදැල්ල

19.අම්බරුවා - මී හරකා

20.උප්පිඩ - එක් අතකට හසුවන ගොයම් කැටිය

21.මාප්පිඩ - උප්පිඩ කීහිපයක් එකතු වූ විට සැදෙන ගොයම් ගොඩ

22.ගොයම් කොළය - මාප්පිඩ හෙවත් ගොයම් මිටි එකතු කර සාදන ගොයම් ගොඩ

23.පළිබෝධකයන් - වගාවට හානිකරන කුඩා සත්තු

24.සොකඩ - ගල් ආදිය ටින් එකකට පුරවා ශබ්ද නැගෙන සේ සකස් කරන උපකරණය

25.සේරංගාව - සතුන් පළවා හැරීම සඳහා සුළං පෙති භාවිත කර සකස් කර ගන්නා උපකරණ

26. දිය හොල්මන - කුඹුරට එන සතුන් පළවා හැරීම සඳහා

27.අලුත් සහල් - අස්වැන්නේ අග්‍ර කොටස දළදා වහන්සේට පූජා කිරීම වෙනුවෙන් පවත්වන උත්සවය

28. සංක්‍රමණය - මාරුවීම

29.දියමංකඩ - වන සතුන්ගේ ගමන නිසා පාර තැනී ඇති වනගත දිය බස්නා තැන

30. කැත්ත - අර්ධ කවාකාර ලෝහමය මුවහත් තලයකට දිය මිටක් සවිකළ ආයුධයක්

31.තුන්සලක් - තුන්වරක්

32.කන්නය - ගොවිතැන් කරන කාලය, ලංකාවේ කන්න දෙකකි.යල ,මහ

33. අනායාසයෙන් - උත්සාහයකින් තොරව

34. අක් වැස්ස - නියඟය අවසන් කරමින් පළමු වරට වසින වැස්ස /අලුත් වැස්ස

35.මහ එකා - අලියා

36.චින්තන ශක්තිය - සිතීමේ හැකියාව

37.මැටිකෝව - කුඹල් කර්මාන්තයේදී මැටි පිළිස්සීම සඳහා භාවිත කරන උපකරණය

38.ප්‍රදීපාලෝක පූජාව - පහන් දල්වා කරන පූජාව

ඔබගේ පෙළපොත 81-87 පිටු දක්වා කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

වී ගොවිතැන

1. දේශයක සභ්‍යත්වය කෙරෙහි බලපාන සාධකයක් ලියන්න.

   ..........................................................................................

2. මිනිසාට මෙන් ම සතුන්ට ද හිතකර වූ ධාර්මික වෘත්ති පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් වල සඳහන් වන්නේ කෙසේ ද ?..........................................................................................................

3. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික වගාව කුමක් ද ? ........................................................

4. ශ්‍රී ලංකාවේ පළමුවන වැව ඉදිකරන ලද්දේ කුමන රජු විසින් ද ?.....................................

5. වැව සඳහා යෙදෙන තවත් සමානාර්ථවත් පදයක් ලියන්න..............................................

6. "දියවර මංගල්‍ය" යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද ?....................................................

7. කෙත හෙවත් කුඹුර සඳහා යෙදෙන තවත් පද ලියන්න.................................................

8. පැරැන්නෝ " දාස " යනුවෙන් හැඳින්වූයේ කා හටද ?................................................

9. පැරැන්නෝ "වෙහෙර් දසන් " යනුවෙන් හඳුන්වන ලද්දේ කවරහුද ?..............................

10."අත්තම " යනු කුමක්ද ?..........................................................................................

11.ගොයම් කයියදා පිළියෙළ කරන ආහාර හඳුන්වන නම් මොනවාද ? ................................

12.කමත හැඳින්වීම සඳහා යෙදෙන තවත් නමක් ලියන්න. ...............................................

13.පහත සඳහන් වචන සඳහා කමත් ව්‍යවහාරයේදී යෙදෙන වචන ලියන්න

I. උදැල්ල-

II. මී හරක් -

III. කුඩා ගොයම් කැටිය -

IV. ගොයම් කැටි එකතු කර සාදන ගොයම් මිටිය -

V. ගොයම් මිටි සාදා සකස් කරන ගොයම් ගොඩ-

14.වගාවට සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීමට ගොවියන් විසින් සකස් කරගන්නා උපකරණ 3 ක් ලියන්න.........................................................................................................

15.වී ගොවිතැනේ දී ආහාරය සඳහා වෙන් කරන ලද ලියැද්ද හැඳින්වෙන නම ලියන්න.

.........................................................................................................................

16.කෘමි උවදුර පාලනය කිරීම සඳහා කුඹුරේ සිටුවන ලද ශාක අතු වර්ග 2 ක් ලියන්න.

.........................................................................................................................

17.පැරණි ගොවියා ධාර්මික ලෙස තම ගොවිතැන් කටයුතු කළ බවට සාක්ෂියක් ලියන්න.

.........................................................................................................................

18.කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගත් සුබ දවස් හා අසුබ දවස් ලියන්න.

සුබ දවස් -.............................................................................

අසුබ දවස් ............................................................................

19.ගොවිතැනෙන් ලබන අස්වැන්නේ අග්‍ර කොටස පූජා කරනු ලබන ස්ථාන 3 ක් ලියන්න.

.........................................................................................................................

20.නුවර කලාවියෙන් ගොවියා කිරි ඉතිරවීම සිදු කරනු ලබන්නේ කවුරුන් වෙනුවෙන් ද?

.........................................................................................................................

## හේන් ගොවිතැන

21.“ වැලිහේන “ දෙමළ ව්‍යවහාරයට එකතු වූයේ කවර නමකින් ද ? ............................

22.හේනක් සකස් කිරීම සඳහා ස්ථානයක් තෝරා ගැනීමේ දී සලකා බලන ලද ප්‍රධාන සාධක 3 ක් ලියන්න.......................................................................................................................

23.හේන් ඇල්ලීම හෙවත් හේන් ගෙවඩීම යනු කුමක් ද ?

.......................................................................................................................

24.හේන් ගෙවඩීම සඳහා තෝරාගන්නා ගස් වර්ග 10 ක් ලියන්න.

.......................................................................................................................

25.හේන් ගිනි ලැමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව හඳුන්වන්නේ කුමන නමකින් ද ?

.......................................................................................................................

26.හේනේ කුරහන් වපුරන්නේ වැසි වැටී කොපමණ කලක් ගත වූ පසුව ද ?

.......................................................................................................................

27.හේන් ගොවිතැනේදී “ මහඑකා “ යනුවෙන් හඳුන්වන්නේ කවර සත්ත්වයා ද ?...................

28.හේන්වලට එන අලි පලවා හැරීමට භාවිත කරන උපක්‍රම 2 ක් ලියන්න.

.......................................................................................................................

## මැටි කර්මාන්තය

29.මැටි කර්මාන්තය හඳුන්වන තවත් නමක් ලියන්න

.......................................................................

30.ලංකාවේ හමුවී ඇති පැරණිතම මැටි බඳුන්වල නෂ්ටාවශේෂ හමු වී ඇත්තේ කොහෙන්ද ?

.......................................................................................................................

31.පැරන්නෝ මැටි කාර්මිකයා හඳුන්වා ඇත්තේ කවර නමකින් ද ?

.......................................................................................................................

32.මැටි බඳුන් පිළිස්සීම සඳහා යොදාගත් උපකරණය කුමක්ද ?

.......................................................................................................................

33.ගහෙන් මැටි භාරා ගැනීමට පෙර මැටි කාර්මිකයා අනුගමනය කළ සිරිතක් ලියන්න

.......................................................................................................................

34.කුඹල් කාර්මිකයකු අලුත් උපදින දරුවකු වෙනුවෙන් කරන සිරිතක් ලියන්න.

.......................................................................................................................

35.කුඹල් කාර්මිකයන් තමාට සිදුවන ලෙඩදුක් ව්‍යසන ආදියේ දී පිහිට පැතුවේ කා වෙතින් ද ?

.......................................................................................................................